අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 287

සියළුම දිස්ත්‍රික් විනිශ්චයකාරවරුන් , මහේස්ත්‍රාත්වරුන් සහ
ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරුන් වෙත,

## <u>පෞද්ගලික හේතු ආදී කරුණු මත නඩු විභාග කිරීම සඳහා වෙනත් විනිශ්චයකාරවරුන් පත් කිරීමට ඉල්ලීම කරන ලද නඩුවල විභාග</u>

නඩුවක පාර්ශවකරුවෙකු හෝ වැදගත් සාක්ෂිකරුවෙකු, නීතිඥවරයෙකු හෝ අධිකරණ කාර්ය මණ්ඩලයක සාමාජිකයෙකු හෝ වෙනත් ආකාරයකින් විනිශ්චයකාරවරයා හඳුනන අයෙකුවීම මත නඩු විභාග නොකිරීමට තීරණය කරන ලද අවස්ථාවන් හෝ එවැනි කරුණු මත වෙනත් විනිශ්චයකාරවරුන් නඩු විභාග කිරීමට පත් කිරීම සඳහා පාර්ශවකරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් ඉදිරිපත් කරන අවස්ථා සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

02 මෙවැනි නඩුවක් විභාග කිරීම සඳහා වෙනත් අධිකරණවල විනිශ්චයකාරවරුන් පත්කළ විට එම දිනයේදී එසේ වෙනත් විනිශ්චයකාරවරුයෙකු පත් කරනු ලැබුවේ යම් අධිකරණයකින්ද, එම අධිකරණයේ නඩු විභාග ඇතුළු සියළු වැඩකටයුතු අඩාල වන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

03 ඒ අනුව මින් ඉදිරියට එවැනි නඩු විභාග සඳහා වෙනත් අධිකරණවලින් විනිශ්චයකාරවරුන් පත් නොකිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04 යම් නඩුවක පාර්ශවකරුවෙකු හෝ වැදගත් සාක්ෂිකරුවෙකු නීතිඥවරයෙකු හෝ අධිකරණ කාර්ය මණ්ඩලයක සාමාජිකයෙකු හෝ විනිශ්චයකාරවරයා හඳුනන තැනැත්තෙකුවීම හෝ යම් පාර්ශවයක් විසින් වෙනත් විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ නඩුව විභාග කළ යුතුයයි ඉල්ලා සිටීම පමණක් විනිශ්චයකාරවරයෙකු විසින් තමන් එම නඩුව විභාග කිරීම නොකළ යුතුයයි තීරණය කිරීමට හේතුවක් නොවේ. කෙසේ නමුත් ව්‍යතිරේක අවස්ථාවන්හිදී යම් අපරාධ නඩුවක් තමන් විසින් විභාග නොකළ යුතු බව විනිශ්චයකාරවරයෙකු තීරණය කරන්නේ නම් එම නඩුව වෙනත් අධිකරණයකට මාරු කිරීම සඳහා ගරු නීතිපතිවරයා වෙත නිර්දේශයක් කරනු ලැබීම සඳහා කරනු ලබන ඉල්ලීමක් කොමිෂන් සභාව විසින් සළකා බලනු ඇත.

05 අපරාධ නඩුවක් නොවන යම් නඩුවකදී මෙවැනි තත්ත්වයක් ඇති වන කළ පාර්ශවකරුවන් විරුද්ධත්වයක් මතු නොකරයි නම් තමන් විසින් නඩුව විභාග කරනු ලබන බවද යම් පාර්ශවකරුවෙකු එකඟ නොවන්නේ නම් එවැන්නෙකු නඩුව වෙනත් අධිකරණයකට මාරු කර ගැනීම සඳහා නීති බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි බවද එකී විනිශ්චයකාරවරයා විසින් පාර්ශවකරුවන්ට දැනුම් දිය යුතුය.

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2004 අගෝස්තු මස 02 වෙනි දින
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය